# රත්තරං බිත්තර දෙන කුකුල් පාලනය

අපේ රටේ ජනතාවගේ ආහාරයට සත්ත්ව ප්‍රෝටීන සැපයූ ප්‍රධානතම මාර්ගයක් ලෙස බිත්තර ඈත අතීතයේ සිටම සැලකුන බව ඉතිහාසය දෙස් දෙයි. මෑතක් වන තුරුම සාමාන්‍ය ජනතාවට සත්ත්ව ප්‍රෝටීන සැපයුන ප්‍රධානතම මාර්ගය වන කරවල හැරුණු විට අනෙක් 'නප්‍රිය මාධ්‍යය බිත්තරයැයි පැව .. ම අතිශයෝක්තියක් නොවේ. මෙයට හේතුවූ කරුනු කිහිපයක් ඇති අතර, මෙරටේ කුකුල් පාලන කර්මාන්තයේ ව්‍යාප්තියට එම කරුනු පරීක්ෂා කිරීම වැඩදයක වෙයි. මෙරටේ ජනතාව අතර මස් පාරිභෝජනය කිරීම ව්‍යාප්ත වීමට ඇති ප්‍රධාන තම බාධකය වන සමාජීය හා ආගමික බාධා මෙම කර්මාන්තය කෙරෙහි තදින් එල්ල නොවන්නේය. මස් කෑම ''පවක්'' ලෙස සළකන සමහරුන් පවා ''බිත්තර'' සළකන්නේ ''පව්'' අඩු ආහාරයක් ලෙසය. ප්‍රජනන ශක්තිය හීන (''පාම බිත්තර'' යනුවෙන් හැඳින්වෙන) කුකුලන් නොමැතිව ලබා ගන්නා බිත්තර නිපදවීමෙන් පසුව බිත්තර කෑම පවක් නොවේය යන අදහස දුන් එම පන කොටස් තුළ ඇතිවී තිබේ.

මෙම කර්මාන්තය පිළිබඳව සැළකීමේදී අනෙක් වැදගත් කරුණ වන්නේ ඉතා සුළු ප්‍රාග්ධනයක් ඇතිව ආරම්භ කළ හැකිවීමයි. මේ නිසාදෝ මෙරටේ ලියාපදිංචි කුකුල් පාලන ගොවිපළවල් වලින් වැඩි කොටසක ගේ හිමිකරුවන් වී ඇත්තේ සුළු පරිමානයේ ආයෝජකයන්ය. ''ශ්‍රී ලංකාවේ කුකුල් පාලන කර්මාන්තය'' නම් පර්යේෂණ ග්‍රන්ථය ඉතා නිවැරිදි ලෙස පෙන්වා දෙන පරිදි ශ්‍රී ලංකාවේ කුකුල් ගොවිපල වලින් සියයට 76.5ක් සතුන් 500ට අඩු ගොවිපළවල් වේ. සියයට 23.5ක් වන අනෙක් ගොවි පළවල් වල ද ඇත්තේ සතුන් 500-5000ත් අතර ප්‍රමාණයකි. සතුන් 5000කට වඩා වැඩියෙන් සිටින ගොවිපළවල් ගෙන් ලැබී නැති බව දක්නට ලැබීම කනගාටුවට කරුණකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවල පැහැදිලිව සඳහන් වන අන්දමට පසුගිය කාලයේ මෙරටේ බිත්තර නිෂ්පාදනය වැඩිවීමට වැඩි බල පෑමක් කර ඇත්තේ පසුගිය කාලයේ ඇති වූ විශාල පරිමාණයේ සත්ත්ව ගොවිපළවල් මිස සුළු පරිමාණයේ ගොවිපළ කරුවන් නොවේ.

එහෙත් මෙම කර්මාන්තයට එළඹුන හා එළඹෙන සුළු පරිමාණයේ සත්ත්ව නිෂ්පාදකයන්හට ඇති

ඇත්තේ දෙහිවල හා බේරුවල යන ප්‍රදේශ දෙකේ පිහිටි ගොවිපළවල් අතලොස්සක් පමණකි. මේ සංඛ්‍යා ලේඛණ සැසැඳීමේදී හා සුළු පරිමාන සත්ත්ව ගොවිපළ කරුවන්ගේ අත් දැකීම බිත්තර වන මෙහි වෙනත් පිටුවක පළවන ''අපේ අත්දැකීම'' හා ''දිවියෙහි කෙහෙදෝ බාධා නැත්තේ'' යන ලිපි වලින් ද අනාවරණය වන පරිදි කුකුල් පාලන කර්මාන්තය අපේ සුළු ගොවීයින් විශාල ප්‍රමාණයකගේ ආර්ථිකය දිරිමත් කරන ප්‍රබල ආධාරකයක්ව පවතී.

එහෙත් ගොවිපළවල් සංඛ්‍යාව පිළිබඳව ඇති මෙම යහපත් බලපෑම බිත්තර නිෂ්පාදනය පිළිබඳව නම් සුළු පරිමාණයේ ගොවිපළ කරුවන්

වන බාධක අභිබවා යහපත් අනාගතයක් ඇති බව කිවමනා නොවේ. ඉන් පළමුවන හේතුව වන්නේ මෙම නිෂ්පාදකයන්ට වෙළඳ පොලේ ඇති හොඳ ඉල්ලුමයි. මෑත ඉතිහාසයේ කිසි දිනෙක අපේ රටේ බිත්තර හා කුකුල් මස් ඉල්ලුම ප්‍රමාණයට සරිලන ලෙස සැපයීමට නිෂ්පාදකයින්ට නොහැකි විය. මේ තත්ත්වය කොතරම් උග්‍රවීදැයි යන්න වෙනත් රටවලින් කුකුල් මස් ආනයනය කිරීමට රජයට සිදුවීමෙන් පෙනේ.

පර්යේෂකයන් විසින් පෙන්වා දෙන පරිදි, අපේ රටේ දනට පවතින ඒක පුද්ගල වාර්ෂික පාරිභෝජනය 14.3 ක් වුවත් මෙරට ජනතාවට ප්‍රෝටීන බහුල සමබර ආහාර ආහාර වේලක් සැපයීමේ රජයේ ප්‍රතිපත්තිය

අනුව, ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය මගින් සකස් කර ඇති වැඩ පිළිවෙල යටතේ මෙරටේ බිත්තර හා කුකුල් මස් අවශ්‍යතාවය සීග්‍රයෙන් තවත් වැඩිවනු ඇත.

මෙම කලාපයේ එන සමහර ලිපි වලින් අනාවරණය වන පරිදි කුකුල් ගොවිපල කරුවනටද බාධක හා ඇහිරතා නැත්තේ නොවේ. එහෙත් එම බාධකද උදහරණයක් වශයෙන් වශයෙන් අලෙවි කරගැනීමේදී මුහුණ පාන්නට වන දුස්කරතා මගහැරවීම සඳහා රජය දැන් වැඩ පිළිවෙලක් යොදගෙන යන බව වාර්තාවේ. ඒ සමඟම, සුළු පරිමාණයේ කුකුල් ගොවිපළ හිමියන්ට මුහුණ පාන්නට සිදුවන බෙහෙත් ද්‍රව්‍ය හිඟය, වෛද්‍ය උපදේශ නොලැබීම වැනි දුෂ්කරතාවයන්ටද ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය පිළියම් යොදගෙන යයි.

නියත ලෙසම, කුමන අන්දමේ ව්‍යාපාරයක් වුවද ආරම්භ කිරීමට සූදානම් වන අපේ තරුණ පරපුරට ඒ සඳහා මූලධනයක් යෙදිය යුතුය. එයට විසඳුම් දෙකක් ඇත්තේය. ඉන් පළමුවැන්න, එබන්දක් සඳහා වැය කරන මූලධන ප්‍රමාණය අඩු කිරීමයි. ඒ සඳහා ඉතා යෝග්‍ය අදහසක් මෙම කලාපයේ "අඩු මුදලකින් ගොවිපළක් තනමු" යන හිසින් පළ වන ලිපියේ සඳහන්වේ. ඒ අනුව අඩු මුදලකින් එවැනි ගොවිපළක් ආරම්භ කිරීම කෙරෙහි අපේ තරුණ පරපුරේ අවධානය යොමුවෙතැයි විශ්වාස කෙරේ. අනෙක් කරුණ වන මූලධනයන් සැපයීම කෙරෙහි රාජ්‍ය බැංකු හා රාජ්‍ය ආයතන අතර දැන් සාකච්ඡා පැවැත්වීම සුබ ලකුණක් වේ.

මේ කරුනු අනුව අපේ තරුණ පරපුර කුකුල් කර්මාන්තයට එළඹීමට මනා පරිසරයක් දැන් සකස් වී ඇත්තේය එය දවෙන ප්‍රශ්නයක් බවට පත්වී ඇති රැකියා හිඟයට යම් පමණකින් විසඳුමක් වන අතර මෙරටේ ජනතාවගේ ආහාරයෙහි පෝෂ්‍ය ගුණය වැඩිකරලීමේ ජාතික කර්තව්‍යයට ආධාර දීමක්ද වනු ඇත

## විවිධ සත්ත්ව ප්‍රෝටීන ආහාර අනුව ප්‍රෝටීන ග්‍රෑමයක වියදම

### බිත්තර

බිත්තර ග්‍රෑම් 100 ක ප්‍රොටීන ග්‍රෑම් 13.3 ක් ඇත.

| | |
|---|---|
| බිත්තරය ශත 80 වුවහොත් බිත්තර ප්‍රෝටීන ග්‍රෑම් එකක් | ශත 16 ක් මිළ වේ. |
| බිත්තරය රු. 1.00 ක් වුවහොත් බිත්තර ප්‍රෝටීන ග්‍රෑම් එකක් | ශත 20 ක් මිළ වේ. |
| බිත්තරය රු. 1.20 ක් වුවහොත් බිත්තර ප්‍රෝටීන් ග්‍රෑම් එකක් | ශත 24 ක් මිළ වේ. |
| බිත්තරය රු. 1.25 ක් වුවහොත් බිත්තර ප්‍රෝටීන් ග්‍රෑම් එකක් | ශත 25 ක් මිළ වේ. |
| බිත්තරය රු. 1.30 ක් වුවහොත් බිත්තර ප්‍රෝටීන් ග්‍රෑම් එකක් | ශත 26 ක් මිළ වේ. |
| බිත්තරය රු. 1.40 ක් වුවහොත් බිත්තර ප්‍රෝටීන් ග්‍රෑම් එකක් | ශත 28 ක් මිළ වේ, |
| බිත්තරය රු. 150 ක් වුවහොත් බිත්තර ප්‍රෝටීන් ග්‍රෑම් එකක් | ශත 30 ක් මිළ වේ. |

### මාළු

මාළු ග්‍රෑම් 100 ක ප්‍රෝටීන් ග්‍රෑම් 19.1 ක් ඇත.

| | |
|---|---|
| මාළු රාත්තල රු. 10.00 ක් වූ විට ප්‍රෝටීන ග්‍රෑමයක මිළ | ශත 17.7 කි |
| මාළු රාත්තල රු. 12.00 ක් වූ විට ප්‍රෝටීන ග්‍රෑමයක මිළ | ශත 21 කි. |
| මාළු රාත්තල රු. 14.00 ක් වූ විට ප්‍රෝටීන ග්‍රෑමයක මිළ | ශත 25 කි. |
| මාළු රාත්තල රු. 16.00 ක් වූ විට ප්‍රෝටීන ග්‍රෑමයක මිළ | ශත 28 කි. |
| මාළු රාත්තල රු. 20.00 ක් වූ විට ප්‍රෝටීන ග්‍රෑමයක මිළ | ශත 31 කි. |

### හරක් මස්

හරක් මස් ග්‍රෑම් 100 ක ප්‍රෝටීන් ග්‍රෑම් 22.6 ක් ඇත.

| | |
|---|---|
| හරක් මස් රාත්තලක මිළ රු. 7.50 ක් වූ විට ප්‍රෝටීන් ග්‍රෑමයක මිළ | ශත 9.5 කි. |
| හරක් මස් රාත්තලක මිළ රු. 8.00 ක් වූ විට ප්‍රෝටීන් ග්‍රෑමයක මිළ | ශත 10.1 කි. |
| හරක්මස් රාත්තලක මිළ රු. 9.00 ක් වූ විට ප්‍රෝටීන් ග්‍රෑමයක මිළ | ශත 10.7 කි. |
| හරක් මස් රාත්තලක මිළ රු. 10.00 ක් වූ විට ප්‍රෝටීන ග්‍රෑමයක මිළ | ශත 11.3 කි. |